# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

10 ශ්‍රේණිය

## ඉතිහාසය - II

නම/ විභාග අංකය: ........................................ කාලය පැය 3 යි

- **I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **II කොටසින් ප්‍රශ්න 05ක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 06කි.**

### I කොටස

01)(අ)

(i) පහත දක්වෙන ඓතිහාසික ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි ලකුණු කොට නම් කරන්න. (ලකුණු 12)

ත්‍රිකුණාමලය, අනුරාධපුරය, ගාල්ල, මහවැලි ගඟ, යාන් ඔය, පල්ලවංක, මහනුවර, පරාක්‍රම සමුද්‍රය, ඉබ්බන්කටුව, කාලතිත්ථ, මාගම, දඹකොළපටුන

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කොට නම් කරන්න. (ලකුණු 6)

රෝමය, කොන්ස්තන්තිනෝපලය, පෘතුගාලය, පර්සියන් බොක්ක, බතාවිය, රතුමුහුද

(ආ)

i. පහත A B C D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A- පැරණි ජනතාව විසින් සීගිරියේ කුරුටු ගී ලියා ඇති ස්ථානය හඳුන්වන්නේ කුමන නමකින්ද?

B- රුවන්වැලි සෑය ඉදිකිරීමේදී අකුණු ගැසීම වැළැක්වීම සඳහා පැරණි ඉංජිනේරුවන් සවිකළ උපකරණයේ නම කුමක්ද?

C- මුල් ඓතිහාසි යුගයේ මිනිසුන් විසින් අතහැර දමා තිබූ වැව් ගම් හැඳින්වූ නම කුමක්ද?

D- කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමය ලැබූ රජතුමා කවුද?

(ලකුණු 4)

ii. A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(a)

i. A රූපයෙන් දක්වා ඇත්තේ කුමක්ද?

ii. එම නිර්මාණය කුමන යුගයට අයත් ද?

iii. එම නිර්මාණය සොයාගත් ප්‍රදේශය නම් කරන්න.

iv. රූප සටහනේ දක්වා ඇති නිර්මාණය උපයෝගී කර ගන්නා ලද්දේ කුමන කාර්යයක් සඳහා ද?

(ලකුණු 4)



A

(b)

i. B රූපයෙන් දැක්වෙන නිර්මාණය හඳුන්වන නම කුමක්ද?

ii. මෙය සොයා ගන්නා ලද්දේ කවර ස්තූපයක කරන ලද කැණීමක්ද?

iii. මෙම නිර්මාණය සිදුකර ඇති ලෝහය කුමක්ද?

iv. මෙම පුරාවස්තුව සොයාගත් ස්ථානයේ දී උපත ලැබුවේ යැයි සැලකෙන රජතුමාගේ නම කුමක්ද?

(ලකුණු 4)



B

## II කොටස

02)

i. ශිලා ලිපි නිර්මාණය කර ඇති ස්වරූපය අනුව වර්ග කළ හැකි ආකාර තුනක් ලියන්න.(ල 3)

ii. විදේශ වෙළඳ සම්බන්ධතා පැවැත්වීමට යොදා ගත් ශ්‍රී ලංකාවේ පැරණි වරායන් දෙකක් නම් කරන්න. (ල 4)

iii. ඉතිහාසය ගොඩනැගීමෙදී ශිලා ලිපි වැදගත් වන ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල 5)

iv. ඉතිහාසය ඉගෙනීමෙන් ලද හැකි ප්‍රයෝජන තුනක් විස්තර කරන්න. (ල 6)

03)

i. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන තුනක් නම් කරන්න. (ල 3)

ii. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයින් අනුභව කළ පිෂ්ඨය සහිත ආහාර වර්ග හතරක් නම් කරන්න. (ල 4)

iii. ප්‍රාග් ඓතිහාසික යුගයේ අභිචාර විධිවල ස්වරූපය පිළිබඳ කරුණු දෙකක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 5)

iv. පූර්ව ඓතිහාසික යුගයේ මානවයා මැටි භාවිතා කිරීමේ තාක්ෂණය වෙත නැඹුරු වූ බව කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල 6)

04)

i. හේන් හැඳින්වීමට පහත සඳහන් වචන භාවිතකර ඇති මූලාශ්‍රය A, B, C අනුපිළිවෙලින් සඳහන් කරන්න. (ල 3)

A- සෙහෙන් B- සේන් C- පිටබිම්

ii. සොරබොර වැව ටැම් ලිපියේ සඳහන් වන පරිදි හෝපිටිගමු වෙළඳපොළ සම්බන්ධ IV වන උදය රජු විසින් පනවා තිබූ නීති දෙකක් ලියන්න. (ල 4)

iii. පැරණි කාලයේ ශ්‍රී ලංකාවේ ඉතා දියුණු මට්ටමක කර්මාන්ත පැවති බවට උදාහරණ දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල 5)

iv. මෙරට පාලනය කළ රජවරු අසල්වැසි රටවල් සමඟ මෙන්ම දුරු රටවල් සමඟ ද සුහදශීලී සම්බන්ධතා පැවැත්වූ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල 6)

05)

i. පහත සඳහන් වැව් කරවන ලද රජවරු කවුරුන්දැයි A, B, C අනුපිළිවෙළින් දක්වන්න.

a) මින්නේරිය වැව b) කලා වැව c) පදවිය වැව

(ල 3)

ii. පහත දැක්වෙන මිනුම් ක්‍රම භාවිතා කර මනින ලද දේවල් කුමක්දැයි වරහන තුළින් තෝරා A, B අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ල 4)

a) ගව්ව b) වියත

(අවකාශය මැනීම/ බර මැනීම/ කෙටිදුර මැනීම/ දිගු දුර මැනීම)

iii. අපේ පැරැන්නන් සතුව පැවති යකඩ නිස්සාරණය කිරීමේ තාක්ෂණය පිළිබඳ උදාහරණ දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ල 5)

iv. මෙරට පැරණි ජල කළමනාකරණයේ විශිෂ්ට අවස්ථා තුනක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල 6)

06)

i. මෙරට සෙල්ලිපිවල සඳහන් තොරතුරුවලට අනුව පහත A, B, C වලින් දැක්වෙන එක් එක් පුද්ගලයන්ගේ තනතුරු නාම අනුපිළිවෙළින් ලියන්න. (ල 3)

A- පවුලක ප්‍රධානියා B- ගමක ප්‍රධානියා

C- ගම් කිහිපයක හෝ වැව් පද්ධතියක ප්‍රධානියා

ii. රජවරුන්ගේ ක්‍රියාකලාපය හා පෙනී සිටි ස්වරූපය අනුව රාජ්‍යත්ව සංකල්ප දෙකක් පහත දැක්වේ. ඊට අදළ රජවරු වරහන තුළින් තෝරා A, B අනුපිළිවෙළින් ලියා දක්වන්න.

(මහසෙන්, කුටකණ්ණ අභය, නිශ්ශංකමල්ල, පළමුවන කාශ්‍යප) (ල 4)

A- පර්වත රාජ B- චක්‍රවර්තී රාජ

iii. රටේ ජනතාව රජතුමාගෙන් අපේක්ෂා කළ සේවා දෙකක් විස්තර කරන්න. (ල 5)

iv. වසභ රජතුමා මෙරට බිහිවූ ශ්‍රේෂ්ඨ පාලකයෙකු බව කරුණු තුනක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ල 6)

07)

i. ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණය අවධියට අයත් පැරණි පරිපාලන නගර තුනක් නම් කරන්න. (ල 3)

ii. පළමුවැනි නාගරීකරණ අවධියට අයත් පැරණි නගර පරිහානියට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. (ල 4)

iii. හයවන පරාක්‍රමබාහු රජුගේ ශ්‍රේෂ්ඨත්වය උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.(ල 5)

iv. දෙවන නාගරීකරණ අවධියේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ ඇතිවූ වෙනස්කම් තුනක් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ල 6)

08)

i. අතීතයේ පැරණි සමාජය තුළ ප්‍රභූන් ලෙස හැඳින්වූ කණ්ඩායම් තුනක් නම් කරන්න. (ල 3)

ii. පැරණි සමාජයේ ක්‍රියාත්මක වූ බදු නීති අනුව පහත සඳහන් බදු වර්ග අය කරන ලද්දේ කුමන කාර්යයන් සඳහා ද? (ල 4)

A- දකපති B- මතරමජිබක

C- බොජකපති D- කැති අඩ

iii. පැරණි කාලයේ දී පවා ශ්‍රී ලාංකික කාන්තාවන්ට ගෞරවයෙන් හා උසස් අන්දමින් සැලකූ ආකාරය නිදසුන් දෙකක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ල 5)

iv. පැරණි සමාජයේ ශ්‍රී ලාංකිකයන් නීරෝගීමත් ශරීරයක් පවත්වා ගෙන යාමට තම ආහාරය ගැන සැලකිලිමත් වූ බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල 6)